ආසියාවේ පළවන
එකම කතෝලික ළමා පුවත් පත

ක්‍රි. ව. 2014 දෙසැම්බර් 01 සඳුදා
07 වෙළුම - 06 කලඹ
සතිපතා පත්‍රය - පිටු 16

LP - QD / 36/ News/ 2014

# ළමා ප්‍රදීපය

මිල රු 10/-



# නත්තල් අසිරිය විඳින්නට
# ආගමන සමයෙන් සැරසෙමු....

Lama Pradeepaya

# ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් lamapradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.com


# ආගමන සමය, නත්තලට සුදනම් වීමේ කාලයයි

## ආදරණීය දුවේ පුතේ...

තවත් ජනවන්දනා වසරක් අරඹමින් අපි ආගමන සමයට එළඹ ඇත්තෙමු. නත්තලට පෙර උදවන මෙම සමය සුදනම්වීමේ කාල පරාසයකි. සැබවින්ම ආගමන සමය ''ක්‍රිස්තු ආගමනය'' ට සුදනම් කිරීමට ශු. සභා මාතාව අපට දනය කර ඇති වරප්‍රසාදයේ සමයකි. ළමා ඔබත් මේ පිළිබඳව දැනුම්වත් වීම ඉතා වැදගත්ය. ''ආගමනය, ''ආගමන සමය'' පිළිබඳව හා කිතු උපත සැමරීමට සුදනම් වන අප ආගමන සමයේදී කෙසේ ක්‍රියා කළ යුතු ද යන්න මෙම ලිපි මගින් හොඳින් අවබෝධ කරගන්න.

සහය සංස්කාරක
**කුමර නයනජිත්**

---

ආගමනය හෙවත් (advent) යන වචනය යෙදුනේ රාජකීයයකුගේ වාර්ෂික නිල බැහැදැකීමක් සඳහා තම රාජ්‍යයේ නගර හා ගම් වලට පැමිණීම ගැන සඳහන් කිරීමට ය. ශු. සභාවේ මුල් සියවස්හි මේ වචනය ක්‍රිස්තුන් වහන්සේගේ පැමිණීම අර්ථ දැක්වීමට ඈඳා ගැනුණි. එසේ රාජකීයයකු තම නගරය බැහැදැකීමට පැමිණීම ජනතාව පුල පුලා බලාපොරොත්තුව සිටි කාරණයකි. එපමණක් නොව ඔවුන් ඊට සූදානම් වීම අනිවාර්යය. සැරසිලි වේවා අනෙකුත් හැම අයුරකින්ම ඊට සංවිධානාත්මක සූදානමින් යුතුව බලාපොරොත්තු දල්වා බලා සිටින්නේ රජු වඩින තුරාවටය. කිතුනුවන් ලෙස අපටත් ආගමන සමය ක්‍රිස්තුන් වහන්සේගේ පැමිණීම ගැන "ප්‍රීතිදායක බලාපොරොත්තුවේ" කාලයකි. මේ සමය පශ්චත්තාපී කාලයක් නොවේ. එහෙත් පශ්චත්තාපය ඊට ඇතුළත් විය හැකිය. ඒ අපගේ ජීවිත උන්වහන්සේගේ ආගමනය පිළිගැනීමට නුසුදුසු යැයි හැඟෙන මොහොතේ දී ය.

ආගමන සමය අපට විශේෂාකාරයෙන් ආරාධනා කරන්නේ ක්‍රිස්තුන් වහන්සේගේ දෙවන පැමිණීම ගැන මෙනෙහි කරන්නටයි. උන්වහන්සේ මහිමාන්විතව දෙවන වර පැමිණීමේ දී සිදුවන පෙර ලකුණු ගැන ස්වාමින් වහන්සේ අපට දැනුම් දුන් සේක. ශු. මාක් තුමාගේ සුවිශේෂයේ 13 වන පරිච්ඡේදය, ශු. ලූක් තුමාගේ සුවිශේෂයේ 21 වන පරිච්ඡේදය, ශු. මතෙව් තුමාගේ සුවිශේෂයේ 24 වන පරිච්ඡේදයන්හි ඒ බව සඳහන් ය.

ගැළවීමේ පොරොන්දුව ආදි මව්පියන් ලද මොහොතේ පටන් දිවැසිවරුන් මඟින් පුරාණ ගිවිසුම පුරා දුන් පොරොන්දු ඉටු කරමින් ලොවට වැඩිය මෙසියස් වහන්සේගේ ආගමනය වෙනුවෙන් පුරාණ ගිවිසුමේ ජනතාව සූදානම් කළ දෙවියන් වහන්සේ තම ඒක ජාතක පුත්‍රයාණන් ලොවට එවා වදාළ සේක. ඒ පොරොන්දුව ඉටු වීම වනාහි ඓතිහාසික සිද්ධියකි. උන්වහන්සේ ලෝක ඉතිහාසය දෙබෑ කරමින් කාලයට ඇතුළු වූ සේක. ඒ පැමිණීම විශ්වාස කරන කිතුනු අපි උන්වහන්සේ ලෝක ගැළවුම්කාරයාණන් බව පිළිගන්නා ජනතාවක් වෙමු. ශු. අගුස්තීනු තුමා සඳහන් කරන පරිදි ක්‍රිස්තුන් වහන්සේගේ පළමු පැමිණීම පිළිගන්නා පුද්ගලයා අත්‍යන්තයෙන්ම උන්වහන්සේගේ දෙවන පැමිණීම පිළිගනී.

දුම්මලදෙනිය මීසම් සේවක
**ගරු ධනුෂ්ක ප්‍රනාන්දු පියතුමා**

---

ජනවන්දනා වර්ෂය තුළ ආගමන සමයට හිමිවන්නේ ප්‍රමුඛ ස්ථානයක්. ඒ ආගමන සමය නත්තලට පෙර සුදනම් වීමේ කාලයක් වන නිසාවෙනි. ක්‍රිස්තුන් වහන්සේ දේවත්වය පසෙකලා දෙව් මව් කුසින් මිනිසත් බව ගැනීමේ ඒ උතුම් අභිරහස අපි නත්තල තුළින් සිහි කරන්නෙමු. ඉතින් ඒ උතුම් මංගල්‍යයට අපේ සූදානම කෙසේද?

විභාගයක් පැමිණෙන විට අපි ඒ සඳහා උනන්දු වෙන් සූදානම් වෙනවා. විනෝද චාරිකාවක් යන විට ඒ සඳහා අවශ්‍ය භාණ්ඩ පිළියෙල කර ගනිමින් සූදානම් වෙනවා. එහෙත් ජේසු බිළිඳුන් අප හදවත් තුළට පිළි ගැනීමට අපේ සුදනම කෙසේදැයි මොහොතක් සිතා බලමු. නත්තල සැමරීමට අප විශේෂාකාරයෙහි බාහිරව සුදනම් වෙනවා. එහෙත් අපේ ඇතුළාන්තය දෙස මොහොතක් හැරී බලමු. අප අතින් සිදුවී ඇති වැරදි අඩුපාඩු සිහිකර ඒවාට සැබවින්ම මෙම කාලය තුළ මනස්ථාපනයක් ඇතිකර ගනිමු.

ආගමන සමයේදී ඉටිපහන් හතරකින් යුත් මල් කළඹක් අපට දකින්නට පුළුවන්. ගතවන එක් එක් සතිය සළකුණු කරමින් ක්‍රම ක්‍රමයෙන් ක්‍රිස්තෝත්පත්ති මංගල්‍ය කරා ළඟා වීම මින් අදහස් කරයි. ඉතින් මෙම ආගමන සමයේදී දිව්‍ය පූජාවට සහභාගිවී පවු සමා කර ගැනීමටත් වැරදි අඩුපාඩු නිවැරදි කර ගැනීමටත් කදිම කාල සීමාවක් වෙයි. අපි ජීවිතයේ විශේෂ අවස්ථාවන් සඳහා විශේෂාකාරයෙන් සුදනම් වෙනවාසේම ආගමන සමය තුළින් අර්ථවත් නත්තලක් කරා පියමන් කරමු.

**සංජුල ජනිත්**
13 ශ්‍රේණිය
ශා. ෆ්‍රැන්සිස් විද්‍යාලය - දළුගම

# ළමුන්ගේ චිත්‍ර හැකියාවන් ඇගයීමට



මඩම්පැල්ල සා. වින්සෙන්තිද පාවුලා සමිතිය මගින් එම බලප්‍රදේශය තුළ පදිංචි 06 ශ්‍රේණියෙන් ඉහළ ඉගෙනුම ලබන ළමුන් සඳහා චිත්‍ර තරඟයක් සංවිධානය කෙරෙණි. එහි ත්‍යාගප්‍රදානෝත්සවය පසුගියදා මඩම්පැල්ල මීසම් සේවක ගරු ලක්නාත් කුරේ පියතුමන්ගේ මුලිකත්වයෙන් පැවැත්විණි. ජයග්‍රාහී සිසුවියක ත්‍යාග ලබා ගන්නා අයුරු සේයාරුවෙහි දිස්වේ.

**සටහන -: කොලින් ප්‍රනාන්දු**
**සේයා -: එච්.ඒ. කල්දේරා**

## විදු මව්නි

**මුළු විශ්වයට එළිය කරන්නට**
**දඟකාර හැඩකාර ලෙස**
**මේ ලෝ ගැබම සුන්දර කරන්නට**
**හැකිවන නිසාමය ගයන්නේ ප්‍රශංසාවෙන්**

**අලුයම් යාමයේ මුළු යායට**
**සුවඳවත් කරවන සමන් පිච්ච මල සේ**
**මේ මහඟු විශ්වයම සුවඳවත් කරන්නට**
**දිරි දුන් පිනි බිඳුව නුඹයි.**
**ශාන්ත ඇනඩෘ විදු මව්නි**

**මල්ෂි ශාලිකා**
12 ශ්‍රේණිය
ශා. ඇන්ඩෘ මධ්‍යමහා විදුහල - පුත්තලම

**මාසික සිතිවිල්ල ජයග්‍රාහී නිර්මාණය ලබන සතියේ පළ කෙරේ**

# ආගමන සමය




පළමුව දෙවියන් වහන්සේ විසින් අප වෙත ඒවා වදාළ ලෝ ගැලවුම්කාර ක්‍රිස්තුස්වහන්සේගේ උපත සමරන්නට සූදනම් වීමේ කාලය දැන් එළඹ තිබේ. ආගමන කාලයේ අපට අභියෝග කරන්නේ ස්වාමින් වහන්සේගේ පැමිණීම අරභයා දැඩි සූදනමකින් සිටීමටයි. ආදර දුවේ පුතේ, ඔබ අසා ඇති පැරණි රසවත් මේ පුංචි කතන්දරය: එක්තරා කාන්තාවකට සුරදූතයෙක් පෙනී සිට පසු දින ජේසු සමිඳුන් ඇය හමුවන්නට පැමිණෙන වග පැවසීය. පසු දින හිමිදිරියේ පිබිදී නිවස අලංකාර ලෙස සූදනම් කොට නොඉවසිලිවත්ව ජේසු සමිඳුන්ගේ පැමිණීම බලාපොරොත්තුවෙන් මඟ බලා සිටියාය.

ඒ නොඉවසිලිමත් කාලය තුළ යාචකයෙක්, අසල් වැසියෙක් , කුඩා දරුවෙක් ඇය කරා පැමිණ සිඟමන් යැද්දෝය තමා ශුවිශේෂ අමුත්තකුගේ පැමිණීම බලා පොරොත්තුවෙන් සිටි නිසා පෙර සඳහන් තිදෙනා මුණ ගැසුනේවත් නැත. ජේසුස් වහන්සේ නොපැමිණීම නිසා ඇය කනස්සල්ලෙන් සිටියාය. ඇය වෙත පෙරදින රාත්‍රියේ පැමිණි සුර දූතයා නැවත වරක් පැමිණ ''අද දින තුන් වතාවක් ජේසුස් වහන්සේ ඔබ වෙත පැමිණි නමුත් ඔබ උන්වහන්සේ පිළිගත්තේ නැතැ''යි ප්‍රකාශ කළේය. මේ පුංචි කථාන්තරයෙන් උන්වහන්සේ වෙස් වළාගෙන පැමිණි බව සනාථ වේ. උන්වහන්සේ ගවහලක උපත ලැබුයේ දිළින්දෙක් ලෙසයි. අද සමාජයේ අප අතර උන්වහන්සේ වැඩ වසන බව අපි විශ්වාස කරමු.

තවත් පැරණි කියමනක් දුවලා පුතාලා අසා ඇති. නත්තල යනු දුගියා බත් කනද යැයි ස්වර්ගස්ථ වී වදාළ ගරු මර්සලින් ජයකොඩි පියතුමා ප්‍රකාශ කර ඇත. අපගේ පාසල් ජීවිතය තුළත් අසරණ දරුවන් අපට මුණ ගැසෙන්නට පුළුවන්. රැකියා විරහිත දෙමව්පියන්ගේ දුගී භාවය නිසා පාසල් උපකරණ මිළ දී ගැනීමට නොහැකි වෙන්න පුළුවන්. අන්න එවැනි අයට අත හිත දීමෙන් අපගේ පාසල් ජීවිතය තුළ ක්‍රිස්තුන් වහන්සේව අත් දකින්නට අපට හැකිවේ.පාසල් ජීවිතය තුළ අපි උපකාරක පංතිවලට ගොස් විභාග යෙන් සමර්ථ වීමට දැඩි උත්සහයක යෙදෙන්නෙමු. විභාගයෙන් සමර්ථ වී උසස් ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සමාජයේ ඉහලම තානාන්තරයක් දරණ රැකියාවක් ලබා ගැනීම අපගේ අපේක්ෂාවයි. අප ලෞකිකත්වය ගොඩ නගන්නට වෙහෙසවන්නාසේම අපගේ අධ්‍යාත්මික ජීවිතය තුළ පෝෂණය ලබන්නට උන්වහන්සේ අපට ආරාධනා කරනු ලබයි.

**මයිකල් සෙබස්තියන් මාමා**



## කුරුණෑගල පදවිය

දුනකදෙනිය මීසමට අයත් පොල්ගහඅගාර දේවස්ථානයේ ළමෝ 16 ක් ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබුහ. මීසම් සේවක ගරු ක්‍රිස්ටි ලෙනාඩ්, මීසම් සහයක ගරු සම්පත් සුජීව පියතුමන්ලා ළමුන් පුහුණු කළ රීටා ප්‍රනාන්දු ගුරුතුමිය සමඟ සමූහ සේයාරුවකට පෙනී සිටි අයුරු. **ජූඩ් ප්‍රැන්සිස්**




## බදුල්ල පදවිය

වැලිමඩ සා. ආනා දේවස්ථානයට අයත් දරු දැරියෝ 23 ක් පසු ගියදා මහනුවර පදවියේ ගරු ඇන්තනි සේවියර් පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැති දේව මෙහෙයේදී පළමු වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබුහ. දේව මෙහෙයෙන් පසුව මීසම් සේවක ගරු සුනිල් විජේරත්න, සහයක ගරු සමීර පෙරේරා පියතුමන්ලා, ගරු පැවිදි සොයුරියන් සහ ගුරුභවතුන් සමූහ සේයාරුවකට පෙනී සිටි අයුරු. **නිලක්ෂි පෙරේරා**





## කොළඹ පදවිය

කට්ටුව සාන්ත ෆ්‍රැන්සිස් සාලිස් කනිටු විදුහලේ සිසු සිසුවියෝ 30 ක් පසුගියදා ප්‍රථමවරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගත්හ. ළමුන් දේව මෙහෙයෙන් පසු කට්ටුව මීසම් සේවක ගරු මංජුල නිරෝෂන් පියතුමා, විදුහල්පතිනිය හා ළමුන් පුහුණු කළ ගුරුවරියන් සමඟ ළමා ප්‍රදීපය සඳහා සමූහ ඡායාරූපයකට පෙනී සිටි අයුරු.

## දේව තාත්තා



මගේ හැම සිතිවිල්ලක්ම බොඳ වී
මා මිරිඟුවකට හසු වී......
මගේ හැම බලාපොරොත්තුවක්ම බිඳ වැටී
එහි සැම පැත්තක්ම අඳුරු වී.........
එහෙත් හැම කරදරයකදීම
මම ඔබ දෙස නෙත් නොපියා
බලා සිටියෙමි දේව තාත්තේ ......
අන් සියළු දෙනා මා කොන් කළත්
ඇයි ඔබ පමණක් මා කොන් නොකළේ
මගේ හැම ලේ බිඳුවක් පාසාම
මම ඔබට ආදරෙයි දේව තාත්තේ........

ඉසුරි නිශාරා
10 ශ්‍රේණිය
දංකොටුව බාලිකා මහා විද්‍යාලය

## මගේ ගම

මගේ ගම කඩුගන්නාවයි. මගේ ගම අයිති වන්නේ මහනුවර දිස්ත්‍රික්කයටයි. මගේ ගමේ දුම්රිය ස්ථානයක් ඇත. මගේ ගමේ "කැප්ටන් ඩෝසන් කුළුන" පිහිටා ඇත. මගේ ගමේ දේවස්ථානය සා. සේවියර් මුනිඳුට කැප කර ඇත.

චමේලි පන්ඩිතරත්න
02 ශ්‍රේණිය
සා. සේවියර් දහම් පාසල - කඩුගන්නාව

**ආදර දුවේ පුතේ,**
**ඔබගේ නිර්මාණ**
**අප වෙත යොමු කරන්න.**
**පිපෙන මල් යාය ළමා**
**ප්‍රදීපය, අංක 02,**
**ඥානාර්ථ ප්‍රදීපය මාවත**
**කොළඹ 08**




## ආච්චියි, සීයයි



අම්මා තාත්තා තරම්ම
ඊටත් වැඩි වැඩියෙනුත්
මා හට ආදරය දුන්
ආච්චි සීයා ඔබයි

නිරතුරුවම සලකමින්
ලැබ දුන් සෙනෙහස නිතින්
නැත මැකෙන්නේ මා සිතින්
ජීවිතේ මගෙ තියෙන්කන්

වත්සලා නිර්මාණි
10 ශ්‍රේණිය
ශා. මරියා දහම් පාසල - වැල්ලවාය

## ආදර අම්මේ



තෙරක් නොපෙනෙන විශ්වයේ
මිලින වූ සිය දහස් තරුකැට
විකසිත කරලීමට දරන මෙහෙවර
අපමණයි මෑණියනි.......
පිච්ච මල් සුවදත්
රෝස මල් සුවදත්
ආදර සුරතල් ඔබේ සිනාවත් මැද
ඔබේ මව් ගුණ
සුවඳ අපමණයි
මගේ මව් රැජිණියනි,
සඳ ණය ගැති වෙමි මා නිරතුරුම
ඔබහට ආදරය වෙමි මා

ෂෙහානි අයේසා
10 ශ්‍රේණිය
ශා. ප්‍රැන්සිස් දහම් පාසල - ගුරුගල්ල

## අත්තික්කා ගසෙන් පාඩමක්

"අත්තික්කා ගසෙන් පාඩමක් ඉගෙන ගන්න. එහි ළපටි අතු මතු වී, කොළ ලියලන කල ගිම්හානය ළඟ යයි ඔබ දන්නාහුය. එලෙසම ඔබත් මේ සියල්ල සිදුවනු දකින විට උන් වහන්සේ දොරකඩම යයි දැන ගන්න. සැබවින්ම මම ඔබට කියමි, මේ සියල්ල සිදුවන තුරු මේ පරම්පරාව පහව් නොයන්නේය. අහසත්, පොළවත් පහව් යන්නේය. එහෙත් මාගේ වචන කිසිදා පහව් නොයන්නේය." (මතෙව් 24/32)

වර්තමාන සමාජය නැතිවීගෙන යන දෙය මිස පවතින දේ ගැන නොසිතයි. ඒ නිසා ලොව පවට නැඹුරු වේ. යහපත දකින්නට නම් දේව වචනයෙන් දිනපතා පෝෂණය විය යුතුය. එවිට එහි අරුතින් අප අධ්‍යාත්මික මඟට සවියක් ලබා ගෙන පවතින ස්වර්ගරාජ්‍යට යාමේ දොරගුළු විවර කර ගනිමු.

දිනුක මධුනුවන්
11 ශ්‍රේණිය
ශා. ආනා විදුහල - කුරුණෑගල

# මළවුන්ගෙ පූජාව

කෙටි කතාව

දිල්කා මොනවද ඔයා කල්පනා කරන්නේ. උදේ ඉඳලම මාත් එක්ක කතා කලෙත් නෑ. සචිනිගෙ කටහඬට මාව ගැස්සිලා ගියා. මම මේ කල්පනා කරන්නේ හෙට ගන්න තියෙන වැඩ පොත් ටික ගැන. පොත් ඔක්කෝටම රුපියල් 600/- ක් යනවා. මා ගාව තියෙන්නේ රු . 500 යි කොහොමහරි හෙට වෙද්දි රු 100 ක් හොයාගන්න ඕනා. අපේ අම්මයි තාත්තයි බස් එකට හැප්පිලා මැරුණ දවසෙ ඉඳලා මාව බලාගන්නේ අපේ ආච්චි. ආච්චි පල්ලිය ළඟ ඉටිපන්දම් විකුණලා ලැබෙන ආදායමෙන් තමායි. අපි දෙන්නා ජීවත් වෙන්නේ. ඉතිං මම කොහොමද අච්චිගෙන් සල්ලි ඉල්ලන්නේ.

මම සචිනිට අපේ පවුල ගැන ඔක්කොම විස්තරේ කිව්වා. අපි දෙන්නා කතාකර කර ඉස්සරහට යද්දි පාරෙ වැටිලා තිබුණු දෙයල් දැකලා මාව නැවතුනා. දෙවියනේ රු 100 කොලයක් පාරෙ වැටිලා තිබුණා පාරෙ කව්රුත් හිටියෙත් නෑ. ඒ හින්ද සචිනි මට ඒ රු 100 අහුලලා දුන්නා. දිල්කිට දැන් වැඩ පොත්ටික ගන්න සල්ලි තියෙනවා නේද කියලා සචිනි කිව්වා. මටත් හරි සතුටුයි. ඒත් එක පාරටම මට මගේ අම්මවයි තාත්තවයි මතක් වුණා. මේ නොවැම්බර් මාසේ කැප කරලා තියෙන්නේ මළවුන් වෙනුවෙන් නේද කියලා මට මතක් වුණා. මට මේ සල්ලි වලින් පොත් එපා සචිනි මම මේ සල්ලි වලින් අම්මටයි තාත්තටයි ජේසු ළඟට යන්න පූජාවක් තියන්න සල්ලි දෙනවා. පහුවෙනිද මම ඉස්කොලේ ගියේ බයෙන් මට වැඩපොත්ගන්න සල්ලි නැති නිසා ටීචර් මට බනියි කියලා හිතුණා. ටීචර් මට කතාකරලා වැඩ පොත් ටික දුන්නා. මට හරි පුදුමයි. මම සචිනි දිහා බැලුවා. සචිනි මටත් එක්ක පොත් ගන්න සල්ලි දීලා තිබුණා. මට ගොඩක් සතුටුහිතුණා. හොඳ දේවල් කරන කොට ඒවා වල ප්‍රතිඵලත් අපට ලැබෙනවා කියලා එදා මම තේරුම් ගත්තා.

**හිරුණි රංසිකා**
10 ශ්‍රේණිය
ශා. ඉසිදෝරු දහම් පාසල - තිබ්බොටුගොඩ

## මීගමුව දිසාවේ දහම් ගුරුභවතුන්ට පුවත්පත් කලාව ගැන දැනුම්වත් කිරීමක්





මීගමුව දිසාවේ දහම් ගුරුභවතුන්ගේ දායකත්වයෙන් ඉදිරියෙදී එළිදකින පුවත්පතකට සංස්කාරක මණ්ඩලයක් තෝරාපත්කර ගැනීමේ අරමුණින් විශේෂ වැඩසටහනක් පසුගියදා මීගමුව, තම්මිට කාදිනල් කුරේ මධ්‍යස්ථාන ශාලාවේදි පැවැත්වුණි. මේ සඳහා මීගමුව දිසාව අයත් මීසම් හී ගුරුභවතුන් එක්විය. මෙය මෙහෙය වූයේ ඥානාර්ථ ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහාතාය. මීගමුව දිසා දහම් පාසල් අධ්‍යක්ෂ ගරු ප්‍රදීප් චමින්ද පියතුමාගේ මගපෙන්වීම යටතේ දිසා ලේකම් හැරල්ඩ් වැලිකඩආරච්චි මහතාගේ සහයෝගයෙන් මෙය සංවිධාන කෙරිනි. **මෙල්වින් ද කොස්තා**

**ළමා ප්‍රදීපය නත්තල් කලාපයට නිර්මාණ එවන්න.**

ළමා ප්‍රදීපය විශේෂ නත්තල් කලාපය සඳහා නත්තල හා බැඳි ඔබගේ නිර්මාණ ( සඳැස්, නිසැඳැස්, ලිපි, කෙටි කතා ) අප වෙත යොමු කරන්න. ඔබගේ නිර්මාණ දෙසැම්බර් 08 වන දිනට පෙර, ළමා ප්‍රදීපය "නත්තල් කලාපය" අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08. යන ලිපිනයට අප වෙත එවන්න.

සංස්කාරක පියතුමා

### එඬේරමුල්ල සුදනම් වරම් ලබන දූ පුතුන්ට විශේෂ දෙසුමක්

එඬේරමුල්ල මීසමේ අභිවෘර්ධි ආලේපය ප්‍රසාද නිධානය ලැබීමට සූදනම් වන ළමුන් සඳහා විශේෂ දෙසුමක් 2014 දෙසැම්බර් 07 වන ඉරුදින එඬේරමුල්ල සා. සෙබස්තියන් දෙව් මැදුරේදී පැවැත්වේ. මෙය මෙහෙයවනු ලබන්නේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතාය. මීසම් සේවක ගරු ප්‍රසන්න රෝහාන් පියතුමන්ගේ අදහසකට අනුව මෙය සංවිධානය කෙරේ.

# ලොවම එළිය කරනා දහම් පාසලක සිසුවෝ

එදින ඔක්තෝබර් මස දෙළොස්වන ඉරු දිනයි. මීගමුව සාන්ත පීතර පාසලේ ඉගෙන ගන්නා උසස් පෙළ සිසු දරු දැරියෝ දහම් ගුරු උපහාර උළෙලක් පවත්වමින් ඔවුන් කළ ඒ ගුණ සත්කාරය මුළු දහම් පාසලටම ආලෝකයක් හා මහගු ආදර්ශයක් විය.




''ටිකයි හොඳයි'' යන වැකිය සනාථ කරමින් 11 ශ්‍රේණිය නිමාවෙන කොට උසස් පෙළ හදාරන්න පන්ති සොයා ගෙන දහම් පාසලෙන් හැලෙන සිසු දරුවන් අතරින් මෙතෙක් ටික දෙනෙක් හෝ ඉතිරි වී උසස් පෙළට දහම ඉගෙන ගැනීමට යොමු වීමත් අති ප්‍රශංසනීයයි. ඒ තුළින් ජීවිතයේ මනා පෞරුෂත්වයක් ගොඩනගාගෙන සමාජයට යහපත් පුරවැසියෙක් වීමට කටයුතු කරන මේ දරු දැරියෝ මෙවර භාවනාත්මකව ගුරු දිනය සැමරීමට උත්සුක වූහ.

එදිනෙද ඉගෙනීමේ කටයුතු අතපසු නොකොට සතියක් පුරා සූදානම් වී ඉතාමත් සාර්ථක ලෙස ගුරු දිනය සැමරීම අප කවුරුත් පැසසිය යුතු කරුණක් විය. පුරුදු පරිදි දහම් පාසල නිමවී උදේ 9.00 ට දහම් පාසල් ගීතය ගායනා කර එක් රැස් වූ සිසු දරු දැරියෝ ආරම්භක යැදුමින් පසු මීසම් භාර පියතුමා ඇතුළු ගුරු මඩුල්ලට බුලත් හුරුල්ලක් දී වැඳ නැමද සුවඳ විහිදෙන ලස්සන රෝස මලක් හා තම දෑත් වලින්ම නිමවුන සිහිවටනයක් දී ඔවුන්ව සතුටට පත් කරන්න සමත් වූ දරුවෝ එදින ඉතාමත් හොඳ කටයුත්තක්ව කළ බවට සාක්ෂි දැරූහ. දහම් පාසල් සිසුවියක් ගුරු වරුන් ඇගයීමට අනගි කතාවක් ඉදිරිපත් කළ අතර දහම් පාසල් ගුරුතුමෙක් ළමුන් වෙනුවෙන් කතාවක්ද ඉදිරිපත් කළහ. අවසානයේ මීසම් භාර පියතුමා ළමුන් කළ ඒ උතුම් සත්කාරය අයගයමින් ලස්සන වදන් පෙළකින් ඔවුන්ව සතුටු කළහ. උසස් පෙළ සිසුවෙක් ලස්සන යැදුමකින් ගුරු උපහාර උළෙල නිමා කළ මීගමුව සාන්ත පීතර දහම් පාසලේ දරු දැරියෝ සිනාමුසු මුහුණෙන් විසිර ගියහ.

මෙවැනි වකවානුවක බොහෝ අවස්ථාවල කළගුණ නොදත් සමාජයක ජීවත් වන අපේ දරුවන්ට මේ ඉටුකල කළගුණ සත්කාරය ඔවුන්ගේ ජීවිතයට ලැබුනු උතුම් වටිනාකමක් විය හැකිය. මේ තුළින් හෙට අනාගතය බාර ගන්න සූදනම් වන ළමුන් ජේසුවගේ ආකල්ප ඇති කරගෙන මේ දේශයේම දේව රාජ්‍ය ගොඩ නැගීමට මංපෙත් විවර කරනු ඇතැයි මම සිතමි.

**එල්සි මුදලිගේ නැන්දා** - මීගමුව

# වත්තල ශා. ආනා ප්‍රාථමිකයේ පහේ හපන්නු



වත්තල ශාන්ත ආනා ප්‍රාථමික විද්‍යාලයෙන් මෙවර පහ වසර ශිෂ්‍යත්ව විභාගයට ඉදිරිපත් වූ සිසුවියන් අතරින් 16 දෙනෙක් එම විභාගය විශිෂ්ට ලෙස සමත් වී තිබේ. ළමුන් ප්‍රාථමික අංශයේ ගුරු භවතුන්, විදුහල්පති ගරු මේරි පැට්‍රිෂ් සොහොයුරිය සමග ළමා ප්‍රදීපය සඳහා සමූහ ඡායාරූපයකට පෙනී සිටිය අයුරු. **ජුලියන් ගුණවර්ධන - හැඳල**

# ආසියාවෙන් බිහි වූ අග්‍රගනා

**භාරත දේශය හෙවත් ඉන්දියාවෙන් අප ලබා ඇති දායාද බොහෝය. ඉතිහාසය දෙස බලන කල ආක්‍රමණ, සංක්‍රමණ තුළින් නිම් හිම් නැති දායාද අපට ලැබෙන්නේද ඉන්දියාවෙනි. විටෙක සංක්‍රමණිකයෝය, තවත් විටෙක ආක්‍රමණිකයෝය. සෙසු රටවල් වලට වඩා භාරතය අපට දේශපාලනය, ආර්ථික, සංස්කෘතික .... වශයෙන් විවිධ සංදර්භයන් ඔස්සේ වැදගත් වෙයි. ආගමික සංදර්භය තුළ බුදු දහම හා හිංදු දහම අපට ලැබෙන්නේද භාරතයෙනි. මෙලෙස ලාංකේය සංස්කෘතික දායාදයන් පසුබිමක් හා පදනමක් වූ භාරතය පසු කලෙක ලක්දිව කිතුදහම කෙරේද ප්‍රබල බලපෑමක් හා දායාදයක් ඇති කළේය.**

පැරණි යුගය තුළ ශාන්ත තෝමස් මුනිඳුන්ගේ සිට පෘතුගීසි යුගය තුළ ධර්මදූතවරුන්ගේ පැමිණීමද සැලකිය යුතු දායාද වන අතර ප්‍රබලම දායදය වන්නේ ලන්දේසි සමයේදීය. බලව්‍යාප්තිය තුළ බටහිර ජාතිය මෙරට ආක්‍රමණය කිරීම තුළින් වෙළදාම හා දහම් ප්‍රචාරය යන අරමුණු මුල්කරගෙන පෘතුගීසීන් ලන්දේසීන් හා ඉංග්‍රීසින් මෙරටට පැමිණියෝය. ඔවුන්ගේ මූලික අරමුණ වූයේ පෙරදිග හා අපරදෙදිග පිහිටි රටවල තම බලය හා ආධිපත්‍යය පිහිටුවාලමින් ඒ ඒ රටවල පවතින සංස්කෘතික දායාද අකා මකා දමා යුරෝපීය සංස්කෘතික ගතිකයන් ඒ ඒ ප්‍රදේශ වල ව්‍යාප්ත කිරීමය. මෙය ලතින් ඇමරිකානු රටවල සාර්ථක වුනිද? ආසියාතික රටවල එලෙස සිදු කිරීම නිශ්ඵල ක්‍රියාදාමයක් විය. මන්ද ලොව පවතින ප්‍රධාන ආගම් 04 ම බිහි වූයේ ආසියා මහද්වීපය නිසාවෙනි. එනමුදු යුරෝපයෙන් පැමිණි ඇතැම් ධර්මදූතවරුන්ගේ ක්‍රියා පටිපාටිය හා දැහැමි දිවිය නිසා මෙරට තුළ කිතු දහම් බීජය ව්‍යාප්ත වූ අතර පසු කාලීනව පෘතුගීසි යුගයේදී බොහෝ ජනතාව කිතු දහම වැළඳ ගත්තේ දේශපාලනීක ස්වරූපය යටතේය.

අද පවතින ලාංකේය කිතු දහමේ ආරම්භය හා විකාශනය සිදුවූයේ පෘතුගීසි යුගයේදී නොව ඕලන්ද හෙවත් ලන්දේසි පීඩන යුගයේදීය. ක්‍රිස්තු වර්ෂ 1658 දී මෙරට පෘතුගීසි පාලන ප්‍රදේශයන්හි බලය පිහිටුවා ගත් ලන්දේසී හු කතෝලිකයන්ට එරෙහිව පීඩනයක් ආරම්භ කළ අතර වසර 30 ක් පමණ කාලයක් පුරාවට කිසිදු පූජා ප්‍රසාදිවරයකු මෙරට නොසිටි අතර මෙරට කතෝලිකයෝ දැඩි තර්ජන ගර්ජන හමුවේ තම විශ්වාසය ස්ථිර කොට ගනිමින් අභීතව ක්‍රියා කළෝය. මේ යුගයේදී ලාංකේය කතෝලිකයන් විඳි පීඩනය හා කරදර කම්කටොළු හමුවේ. ඒ පිළිබඳ එක්තරා සුභදායී පුවතක් භාරතය තුළ ආරම්භ විය. එය ලාංකේය කතෝලිකයන්ට ගැලවුම්කරුවෙක් ලෙස පැමිණීමක්ය. එතුමා නමින් ජෝසප් නයික් වාස්ය. හෙළ බසින් ජුසේවාස්ය. ක්‍රි.ව. 1651 අප්‍රේල් 21 වන දින ගෝවා පුරයේ සල්සෙට්ටි දිස්ත්‍රික්කයේ බෙනුවාලිම් ග්‍රාමයේදී එතුමා උපත ලද අතර කුඩා කල සිටම දැහැමි දරුවකු ලෙස දිවි ගෙවමින් සිය දිවිමග පුරාවටම ''සුදුවර'' ''සාධු'' චරිතයකින් යුතු විය. සිය අරමුණ වූයේ පූජා ප්‍රසාදිවරයෙකු වීමයි. එකී අරමුණ හා අභිලාශය ක්‍රි.ව. 1676 දී සාක්ෂාත් කරගත් මෙතුමා වසර කිහිපයක් පුරාවටම ගෝවාපුරය හා කැනරාව (මැංගලෝර්) ආදී ප්‍රදේශවල සේවය කල අතර මෙහිදී ලක්දිව කතෝලිකයන් විඳි පීඩන හා තර්ජන ගර්ජන පිළිබඳව එතුමන්ට අසන්නට ලැබිණ.

මෙහිදී ක්‍රි.ව. 1685 දී ආසියාවේ ප්‍රථම ස්වදේශීය පැවිදි පන්තිය ආරම්භ කළ මෙතුමා එහි අරමුණ ලෙස අදිටන් කර ගත්තේ පීඩනයට පත් ලංකාවට ධර්මදූතවරුන් එවීමටය. එයින් නොනැවතුනු මෙතුමා ක්‍රි.ව. 1687 දී යාචක වෙස්ගෙන සිය සේවක ජෝන් නැමති තරුණයාද කැටුව ලක්දිව බලායන්නට පිටත් වූ අතර යාපනයට යායුතු නැව කුණාටුවකට ලක්ව මන්නාරමට සේන්දු විය. එතැන් සිට වසර 24 ක කාලයක් පුරා අප්‍රතිහත ධෛර්යය තුළින් මෙරට තුළ කිතුනු විශ්වාසය යළිදු ගොඩනග න්නට මෙතුමා වෙර දැරීය. එහිදී සිදු කරන ලද දායකත්වය වදනින් කියා විස්තර කළ නොහැකිය. දිවා රෑ නොබලා හිස් දෙපතුලින් ඇවිදිමින්, නානාවිධ වෙස් ගනිමින් මෙරට කිතුනු විශ්වාසය දල්වා ලන්නට කුසගිනි දරා, කැලෑ මැදින් දෙපා වැරෙන් ගිය ගමන් මග උදෙසා ලාංකේය කතෝලික සභාව සදා එතුමන්ට ණය ගැතිය. මේ පියවර එතුමන්ගේ ජීවිත පිය සටහන් ගැන සොයා බැලීමටයි.



### බෙනුවාලිම්හි පිහිටි මවගේ නිවස

ගෝවා පුරයේ සැල්සෙට් ප්‍රදේශයේ, සැන්කෝලයේ, වර්ෂ 1651 අප්‍රේල් මස 21 වැනි දින ජුසේ වාස් පියතුමා උපත ලද්දේය. ඉන්දියාවේ ස්වකීය අධිරාජ්‍යය අභිමි වූ පසුවත් මේ භූමිය පෘතුගාලයට අයත් වූ ප්‍රදේශයක් විය. ජුසේ වාස් පියතුමාගේ දෙමව්පියන් වූයේ ක්‍රිස්තෝපර් වාස් හා මාරියා මිරැන්ඩා නැමති බ්‍රාහ්මණ කුලයේ කොන්කානි බැතිමත් ඉන්දියා යුවලක්ය.තම මව් පාර්ශවයේ මිත්තනුවන්ගේ නිවසේදී ජුසේ වාස් පියතු මෙලොවට බිහි විය.

# ය යාචක ධර්මදූතවරයාණෝ




### සැන්කෝලේහි හි පිහිටි පියාගේ නිවස

ජුසේ වාස් පියතුමා හැදී වැඩුණේ මේ නිවසේ දීය. ළදරු අවධිය පිළිබඳ තොරතුරු මෙලෙස හෙළි කරයි. 'ඔහුගේ සම වයසේ දරුවන් කෙළිදෙලෙන් කාලය ගත කරද්දී ඔහු වඩාත් ප්‍රිය කළේ නිසල ස්ථානයකට වී යාච්ඤා කරන්නටය. දිනපතා දේව මෙහෙයට සහභාගි වූ ඔහු, පූජාප්‍රසාදීතුමා දිව්‍ය සත්ප්‍රසාදීන් වහන්සේ රෝගීන් වෙත ගෙන යන අවස්ථාවලටද සහභාගි විය. එසේම මළවුන් සොහොන් භූමිය වෙත ගෙන යන අවස්ථාවලට සහභාගි වීම වඩාත් ප්‍රියකල මොහු, රාත්‍රී කාලයේ දැන හඳුනන සියල්ලන් වෙත ගොස් ඔවුන්ගේ යාච්ඤා වලටද විශේෂයෙන් මළවුන් වෙනුවෙන් යාච්ඤා ඔප්පු කරන මෙන් ඉල්ලා සිටියේය.



### කෝර්ටාලිම් ගමේ පිහිටි ශු. පිලිප් හා සිමියොන් යන අපෝස්තුළුවරුන්ට කැපවූ දේවස්ථානය

යාච්ඤාවේ නිරත වීමට මෙතුමානන්ට වේලාවක් නොවීය. ඇතැම් අවස්ථා වලදී රාත්‍රී කාලයේ පවා දේව ලැදියාව නිසාම මෙතුමා තම පියාගේ නිවසට යාබද කෝර්ටාලිම් ගමේ පිහිටි ශු. පිලිප් හා සිමියොන් යන අපෝස්තුළුවරුන්ට කැපවූ දේවස්ථානයට ගියේය. මෙතුමා මෙම දේවස්ථානයට යන කල්හි එහිදී වසා තිබූ දේවස්ථානයේ දොරවල් මෙතුමා අතතැබූ සැනින්ම විවෘත වූ බව සඳහන් වේ.





### බෙනුවාලිම්හි පිහිටි ශු. ස්නාවක ජුවාම් මුනිඳුන්ට කැපවූ දේවස්ථානය

ජුසේ වාස් පියතුමා උපත ලබා අට වැනි දින බෞතීස්ම කරන ලදි. ඒ බෙනුවාලිම්හි පිහිටි ශු. ස්නාවක ජුවාම් මුනිඳුන්ට කැපවූ දේවස්ථානයේය. මෙතුමන්ව බෞතීස්ම කරන ලද්දේ ගරු ජයසින්ත් පෙරේරා පියතුමා විසින් ය. මෙතුමන්ව බෞතීස්ම කරන ලද ප්‍රසාද ස්නාපනීය තටාකය තවමත් දක්නට ඇත.

**ලබන සතියට**

**අසේල දසනායක**

# Unknown Catholic Saints

## St Vitus

### Feast Day - (June 15)



*The Gothic St Vitus Cathedral in Prague*

St Vitus appears in early lists of Christian martyrs, and probably died during the persecution of Diocletian, which reached its climax in 303. He is a patron saint of Prague, coppersmiths and actors, and his intercession has been invoked against snake bites, lightning and sleeplessness. Chiefly, though, he has been associated with St Vitus's Dance.

Historically this term has been used to describe all kinds of nervous disorders involving rapid, jerky, involuntary movements; it has also been applied to epilepsy. Today, St Vitus's Dance is more austerely defined as Sydenham's Chorea, a disease which induces grimacing and jerking in children and pregnant women, and which is often linked to rheumatic fever.

Nothing certain is known of Vitus, apart from the fact of his martyrdom. There is a legend that he expelled an evil spirit from Diocletian's son, though it is not clear whether this is the cause or the consequence of his association with neurological symptoms.

As to his origins, tradition relates that Vitus hailed from Sicily, where he was converted to Christianity while still a boy, to the great disgust and rage of his father, a senator.

Guided by an angel, and sustained with food brought by an eagle, the youth escaped to Italy with his tutor Modes-tus and his maid Crescentia. The miraculous cures he effected led to accusations of sorcery, while his refusal to worship pagan gods attracted the malignant attention of authority.

Flung into a cauldron of molten lead, Vitus apparently emerged as from a refreshing bath. Then a lion to which he was exposed crouched before him and licked his feet. Yet Vitus eventually perished from the tortures he suffered, as did Modestus and Crescentia. The church of St Vitus on the Esquiline Hill in Rome dates from the eighth century.

In 775 his relics found a home at St Denis (now in Paris) until translated in 836 to Corvey in Saxony. Subsequently his cult became popular throughout Germany. In the early 10th century King Wenceslas obtained one of Virus's arms from the Emperor Henry I, and dedicated to the saint the cathedral he was building in Prague

During the Black Death, in the 14th century, there were outbreaks of hysterical dancing in Europe, seemingly caused by mental breakdown in the face of the irresistible incursion of mortality.

Prayers were offered to St Vitus in the hope of allaying this "dancing plague", and he became recognised as one of the Fourteen Holy Helpers to those in extremis. Their group feast, on August 8, was abolished only in 1969. "If St Vitus's Day be rainy weather, it shall rain for 30 days together," ran the old saw, a forecast applied with equal unreliability to the feast of St Swithin on July 15.

# මරි මව්නි ඔබයි මගේ ආදරයයි

## (දෙව්මව් සමඟ විශේෂිත වූ අත්දැකීමකි)



ජේසු අම්මේ, ඔබගේ ආදරය, රැකවරණය තුළ මගේ උතුම් ජීවිතය, නැවත මට ලබා දුන්නාට ස්තූතියි. මගේ නම රොෂනාරා පෙරේරා. වයස අවුරුදු 23 යි. පසුගියදා මම යහළු යෙහෙළියන් කිහිපදෙනෙකු සමඟ සති අන්ත විනෝද චාරිකාවක් සඳහා අවිස්සාවෙල්ල ප්‍රදේශයේ තුම්මෝදර පිහිටි ගංගාවක් තෝරා ගත්තේ හැමදෙනාගේම ඉමහත් කැමැත්තෙන්ය. උදේ පාන්දර අවදි වී, දෙව්මව් සමඟ, ජේසුගේ ආදරය, යාච්ඤාව තුලින් ඔප්පු කළ මම මෙම විනෝද චාරිකාව සඳහා නිවසින් පිටත් වූයේ මගේ දෙමාපියන්ගේ ආශිර්වාදය තුළින්මයි. විශේෂ සුඛෝපභෝගී බස් රථයක අපි සැමදෙනාම තුම්මෝදර බලා පිටත්වූයේ හදපිරි සතුටිනි. ඉන්පසු සංගීතයෙන් මුසුවුනු රිද්මයකට අපි සැමදෙනා විනෝද විය. අතරමඟදී අපි උදේ ආහාරය අනුභව කළේය. මගේ අම්මා හා තාත්තා හැමවිටම මගේ ජංගම දුරකථනය හා සම්බන්ධ වී කියා පෑවේ ජේසුගේ ආදරය තුළ පරිස්සම් වන්නට කියාය. දඟකාර, කෙළිලොල් තරුණියක නොවූ මම ගැන දෙමාපියන් කිසිසේත්ම බය වූයේ නැත.

මෙම සිද්ධිය වීමටත් පෙර මිනිත්තු ගණනකට පෙර මගේ අම්මා පැවසුවේ "ගඟට බහින්න එපා. ඈතකට යන්න එපා" කියාය. නමුත් මම ඒ කීම නොතකා මාගේ මිතුරිය තිළිණි සමඟ අත්වැල් බැඳගෙන ගඟට බැස, විනෝද වුනෙමි. මා හට පිහිනීම ගැන අවබෝධයක් නොමැතිව වුවද, ගලින් ගලට පය තබා ඈතට ගියෙමි. එවිට එක් මිතුරෙකු මා හට පැවසුවේ, මා ඉන්න තැන ගැඹුරුයි, මේ පැත්තට එන්න කියාය. මා එම ස්ථානයට පා තබනවාත් සමඟම, මට දැනුනේ මා ගඟ තුළට ගිල ගන්නා බවය. ඒ මොහොතේ මට කර කියා ගන්නට දෙයක් නොමැති විය. දැඩි උත්සහයක් දැරුවත්, මා තව තවත් ගැඹුරට ගිල ගත්තේය. එවිට මට ක්ෂණිකයින් මතක වූයේ මාගේ ආදරණීය අම්මා සහ ජේසු අම්මාවයි. මම "අම්මේ" කියා කෑගසනවාත් සමඟම "**Hail Mary**" කියා දෙවරක් මුළු සිතින්ම අයැද්දෙමි. කිමදයත්, මට ඒ මොහොතේ මරණ බිය දැනුනු බැවිනි. එවිට එක පාරටම මට දිස්වුයේ නිල් පාට එළියකි. එය මරි මව්ගේ සළුව බව මා වටහා ගන්නවාත් සමඟම මට දැනුනේ, මා තුරුළු කරගෙන මාව ගං ඉවුරට ගෙනියන බවය. මා කෙසේ ගඟ ඇතුළේදී හුස්ම ගත්තාද කියා මට තවමත් නොවැටහේ. ගං ඉවුරට ආ පසු මට සුළු තුවාල කිහිපයක් වී තිබුණද, වෙන මොනයම් අපහසුතාවක්වත් දැනුණේ නැත. විනාඩි කිහිපයකට පසු මට වැටහුනේ, මරිමව් ලෙස මා හට උදව්වට පැමිණ තිබුණේ, අප හා විනෝද චාරිකාවට එක් වූ සාමාජික යෙක්ය. ඔහු මා ගිලගන්නා අවස්ථාවේදී ගලක් උඩ සිට තිබෙනවා. නමුත් ඔහුට වැටහී නැත මා ගිලෙන බව, ඔහු සිතා ඇත්තේ, මා යෙහෙළිය සමඟ සෙල්ලමක යෙදී සිටින බවය. නිල් පාට සළුව වී තිබුණේ ඔහු හැඳ සිටි නිල්පාට කමිසයයි. තත්පර කිහිපයකින් මේ සියල්ලම වටහාගත් මා, ජේසු අම්මාට තුති පිදුවේ මෙලෙසය.

"ජේසු අම්මේ, මා ඔබට ආදරෙයි" කියාය. මා එයට නොපසුබට නොවුයෙමි. උපතින්ම කතෝලික පවුලක උපන් මම, දේව සේවයට කැපවී සිටින්නේ පරම්පරා ගණනාවක සිටමය. ආච්චි අම්මාගේ දේව සේවය තුළින් සේවය කරන මාගේ මවගේ සේවය බලාගෙන මමද, ජේසුට සේවය කරන්නේ ඉමහත් ආශාවෙනි. එමෙන්මෙ මට පව සන්නට තිබෙන්නේ, ජේසු අම්මේ, ඔබගේ කරුණාබර අත, මා වෙත පා මට ජීවිතය නැවත ලබා දුන්නා වූ ඔබ තුමියට බෙහෙවින් ස්තූතියි. ජේසු අම්මාගේ රැකවරණය හා බලය ගැන මාගේ ගමටම පමණක් නොව මුළු රටටම එපමණක් නොව මුළු ලෝකයටම ප්‍රකාශ කරන්නෙමු. හඬනගා කියන්නට මට වචන නැත. නමුත් එක බලයක් ඇත. "ජේසු අම්මේ, මම ඔබට ආදරෙයි".

**දිනක්ෂි රොෂනාරා - එඬේරමුල්ල.**

## පුංචි අපේ චිත්‍ර පිටුව



**දෙවිඳුන් මැවූ ලෝකය**

**අදීෂා නිහාරි**

02 ශ්‍රේණිය

ජයලත් අපස්වාමිදුගේ කන්‍යාරාමය - මොරටුව

**නිර්මල හෘදයේ මාතාව**

**දෙව්මිණ නිරාන්**

04 ශ්‍රේණිය

ශා. පීතර විදුහල - උඩුගම්පල





**සරුංගල යවන ළමුන්**

**ශෙවෝනි පෙරේරා**

08 ශ්‍රේණිය

සිරි කුරුස දහම් පාසල - ගම්පහ

**අපේ රදගුරුහිමිපාණෝ**

**විකුම් දේවින්ද**

02 ශ්‍රේණිය

සා. බෙනදික්ත විදුහල

කොටහේන, කොළඹ 13





**ශ්‍රී ශරීරය**

**නිමාලි දෙව්මිනි**

06 ශ්‍රේණිය

සා. ජෝශප් දහම් පාසල

පහත්ගම (හංවැල්ල මීසම)



**අපේ ගමේ පොළ**

**සඳුනි නිසංසලා**

07 ශ්‍රේණිය

පිරිසිදු දේව මාතා

ධර්මදූත ළමා සමාජය - කඳාන



**සුදුවර චරිතයක් හඳුනාගනිමු**

# සා. අපොල්ලෝනියා මුනිවරිය



| | |
|---|---|
| **අරක්ගත් මුනිවරිය** | **: දත් කැක්කුමෙන් පෙළෙන්නන්ගේ හා දන්ත වෛද්‍යවරුන්ගේ** |
| **ජීවිත කාලය** | **: වර්ෂ 249 දී** |
| **මංගල්‍යය දිනය** | **: පෙබරවාරි 09** |

ඩේසියුස් අධිරාජ්‍යාගේ වර්ෂ 249 තම තනතුරු බාරගන්නා කාලයේ පාලන තත්වය ඉතා දරුණු අතට හැරෙමින් තිබුණි. හැම අතින්ම පැමිණෙන බාබේරියන් වරුන්ට විරුද්ධව සටන් කිරීමට ඔහුට සිදුවිය. දේශපාලන කැරළිකෝලහාල නිසා සෙනෙට් වරුන් , උසස් නිල ඇත්තන් ඇතුළු බොහෝ දෙනා ආරක්ෂාව සඳහා ගම්බදට පලා ගියහ.

අධිරාජ්‍යා වර්ෂ 249 දී රෝම පැරණි දෙවි දේවතාවන්ගේ ආරක්ෂාව පැතීය. එනිසා මුළු රෝම අධිරාජ්‍යට ම ආඥාවක් යවමින් එසේ කරන ලෙස අණකරන ලදී. මෙය ක්‍රිස්තියානීන්ට පිළිගත නොහැක්කක් විය. එසේම පසුගිය වසර 200 තුළ විවිධ තැන්වල විවිධ ක්‍රමයට ක්‍රිස්තියානීන් ට පීඩා කෙරිනි. ඩේසියුස්ගේ සමයේ ද අධිරාජ්‍ය පුරාම ක්‍රිස්තියානි පීඩනය පැවතුණි.

දියෝනිසියුස් රදගුරු තුමා සඳහන් කරන අන්දමට එසේ පීඩාවට පත්වුවන් අතර පුදුමාකාර කාන්තාවක් වන අපොල්ලෝනියා ද විය. ඔහු එතුමිටය ගැන මෙසේ සඳහන් කරයි. " එතුමියට දැඩි ලෙස පහර දුන්න ඔවුන් හිසටද කම්මුල් වලටද පහර දුන් අතර දත් උදුරා දැමූහ. පසුව ගේට්ටුවෙන් එපිටට ඇදගෙන ගොස් තවත් අය සමග ගින්නට දැමුහ''. එතුමීව සිත්තම් කර ඇත්තේ ඉතාම සුරූපී කාන්තාවක් විශාල අඬුවකින් දතක් අල්ලාගෙන ඉන්නා ලෙසය.

**අසේල දසනායක විසිනි**




ප්‍රදීපය ලේඛක ලූෂන් එඩ්වඩ් පෙරේරා මහතාගේ ''කරුණාවේ බලය'' ළමා ග්‍රන්ථය පසුගියද නිකුත් කෙරෙනි. දරුවන්ට හොඳ සිරිත් විරිත් කියා දෙන මෙම ග්‍රන්ථයට ඇතුළත් කොට ඇත්තේ ලේඛක මහතා ''මිහිර'' පුවත් පතට ලියූ ලිපි එකතුවයි. ගොඩගේ ප්‍රකාශයක් ලෙසින් දෙරට වැඩිය මෙම ග්‍රන්ථයේ මිල රු.150 යි. ළමා පරපුර යහමගට ගැනීමේ උදාර අරමුණින් යුතුව ළමුන් වෙනුවෙන්ම ග්‍රන්ථයක් ලියූ ලූෂන් එඩ්වඩ් මහතාට ළමා ප්‍රදීපය සුබ පැතුම්. **කුමර**


ශුද්ධවූ බයිබලය ඇසුරෙනි
මෝසෙස්
76
සැකසුම, දෙබස්, චිත්‍ර
පාලිත සපුආරච්චි
අෝ.. මේ තියෙන්නේ.. වතුර.. ඇතිතරම් වතුර තියෙනවා.. බීපල්ලා.
දෙවියන් වහන්සේට ම ස්තුති වේවා.
දෙවියන් වහන්සේට ස්තුති කරපල්ලා..
ඉශ්‍රායෙල්වරු.. ඒ අමෝරිවරුන්ගේ දේශය යම පැමිණියෝය..
හෙෂ්බොන්හි සීහොන් රජ වෙතට ගොස් ඔහුගේ රට මැදින් අපට ගමන් ගන්ට අවසර ලබාගෙන එවෙල්ලා..
අපට ඔබතුමාගේ රාජ්‍යය මැදින් ගමන් ගන්ට අවසර ලබා දෙන්න රජතුමනි...
අෝ.. කවුරු නුඹලා එහෙම යන්ට ඉඩ දෙන්ඩ බැහැ.. අපි නුඹලාව මරා දමනවා නුඹලාන් සමග සටනට
සීහොන් රජු ඉශ්‍රායෙල්වරු සමග සටනට ආහ...
එහෙත් ඉශ්‍රායෙල්වරුන් හා සටනින් පැරදුන සීහොන් රජු පලා ගියේය...
අන්න සීහොන් රජු පලා යනවා.

# ප්‍රහේලිකා අංක 48




## හරහට

1. ක්‍රිස්තුන් වහන්සේ තම ඉගැන්වීම් වලට මෙම ගස බොහෝ විට යොදා ගත් සේක.

4. යක්ෂයා ක්‍රිස්තුන් වහන්සේව උස් තැනකට පමුණුවා , ලෝකයේ සියළු රට රාජ්‍යයන් හා ඒවායේ ..... ඉසුරු ද පෙන්වා, යක්ෂයාට වඳින්නේ නම් ඒවා ලබා දෙන බව කීවේය. මෙහි හිස්තැනට සුදුසු වචනය

6. ....................විශ්වාස කිරීම සෙවනැන්ලක් අල්ලා ගැනීම වැනියැයි උපදේශකයා හෙවත් සිරාක් පවසයි. . මෙහි හිස්තැනට සුදුසු වචනය.

8. මිනිසෙකුගේ ගමන් මග සමිඳාණෝ මෙහෙයවන සේක. එසේනම් යමෙකුට තමා..................මග තේරුම් ගත හැකිදැයි හිතෝපදේශයේ විමසයි. මෙහි හිස්තැනට සුදුසු වචනය

## පහළට

1. ''ක්‍රිස්තියානි'' යන නාමය ගෝලයින්ට පළමු කොට දෙනු ලැබුවේ මෙහිදීය.

2. ක්‍රිස්තුන් වහන්සේ පන්දහසකට කෑම ලබා දීමේ සිද්ධියට පෙර මෙම මුහුදෙන් එගොඩට වැඩම කළ බව ශුද්ධවූ ජුවාම් තුමා පවසයි.

3. පව්කාරයා මනස්ථාපනය වී පැමිණෙන තුරු දෙවිපියාණන් වහන්සේ අත් නොහැර බලා සිටින බවත්, එසේ පැමිණි විට සන්තෝෂවන බවත් පෙන්වූ එක් උපමාවකි, නැති වූ ......... පිළිබඳ උපමාව. මෙහි හිස්තැනට සුදුසු වචනය

5. වෙහෙසවන , බර උසුලන සියල්ලෙනි, මා වෙතට එන්න. මම ඔබට ...... දෙමි. ක්‍රිස්තුන් වහන්සේ වදාල සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය

7. ජෝසප්ගේ සහෝදරයන් ඔහු සමග ඊර්ෂ්‍යාවෙන් ජෝසප්ව මෙවැන්නක හෙළුවේය.

> **මෙම ප්‍රහේලිකාව පිරවීමේ දී පහත සඳහන් බයිබල් පාඨ ද උපකාර කරගත හැකිය. ශු. ලූක් 4/6, 15/8, ශු මාක් 11/20, ශු. මතෙව් 11/28 , ශු. ජුවාම් 6/1, ක්‍රියා 11/26, උපදේශකය හෙවත් සිරාක් 34/2, හිතෝපදේශය 20/24, උත්පත්ති 37/24**

**සැකසුම :- තිළිණි දුතිකා පෙරේරා - කිරිමැටියාගාර**

**ප්‍රහේලිකා අංක 48 පිළිතුරු හා ප්‍රහේලිකා අංක 49 ලබන සතියේ**



අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද 2014 සමස්ත ලංකා පාසල් ක්‍රීඩා තරඟ මාලාවේ මල්ලවපොර තරඟ ඉසව්වෙන් දස්කම් පෑමට ශාන්ත ජෝශප් විද්‍යාලය වත්තල ශාඛාවේ ළමෝ සමත්වූහ. පාසලේ මල්ලව පොර සංචිතයේ පිරිස ෂෙනාල් අනුරුද්ධික , රොෂාන් ෆොන්සේකා (ක්‍රීඩා භාර), අර්ලි ප්‍රසන්න (කණ්ඩායම් පුහුණුකරු), ගරු ගැමුණු ඩයස් පියතුමා (විදුහල්පති) ගරු කමල් කුමාර පියතුමා (උප විදුහල්පති), ප්‍රදීප් සිසිර (මල්ලව පොර ක්‍රීඩා අංශභාර). සංදීප උදයන්ත (සහයක පුහුණුකරු) සමඟ සමූහ සේයාරුවකට පෙනී සිටි අයුරු. (සේයාරුවේහි ඉදිරිපෙල වමේ සිට දකුණට) **පද්මිණී නානායක්කාර**

# දෙමටගොඩ ශාන්ත ජෝන් විද්‍යාලයේ නත්තල් උත්සවය





දෙමටගොඩ ශාන්ත ජෝන් විද්‍යාලයේ නත්තල් උත්සවය "උපතක මහිමය" පසුගියදා විද්‍යාලීය ප්‍රධාන ශාලාවේදී පැවැත්වුණි. මෙය විද්‍යාලීය කතෝලික සමිතිය මගින් සංවිධානය කෙරෙනි. ජාඇල කලාපීය දහම් පාසල් අධ්‍යක්ෂ ගරු ලෙස්ටර් නෝනිස් පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙයට බොරැල්ල කාර්මෙල් කන්‍යාරාමයේ ප්‍රධාන මව්තුමිය ගරු මේරි ප්‍රදීපා පැවිදි සොයුරිය ඇතුළු ගරු පැවිදි සොයුරියන් සහභාගී විය. විදුහල්පති, බණ්ඩාර දිසානායක මහතාගේ මග පෙන්වීම යටතේ විද්‍යාලයේ ගරු මරිය දිලූෂා පැවිදි සොයුරියගේ අධීක්ෂණයෙන් සංවිධානය කළ මෙම උත්සවයට සමගාමීව ළමුන් සඳහා නත්තල් ශුභ පැතුම් පත් හා චිත්‍ර තරඟයක්ද පැවැත්වුණි. මෙදින අවස්ථාවක් සේයාරුවෙහි දිස්වේ.

**මොහොමඩ් සෆ්රාන්**
ශා. ජොන් විද්‍යාලය, දෙමටගොඩ











